සියලු ම හිමිකම් ඇවිරිණි.


රහස්‍ය ලේඛනයකි.

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2018

# 66 - පාලි

### ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

# 66 - පාලි
## ලකුණුදීමේ පටිපාටිය

01. **ප්‍රශ්නය**

නිවැරදි පිළිතුරකට ලකුණු 02 බැගින් ලකුණු 20 කි. **(ලකුණු 20)**

02. **ප්‍රශ්නය**

(අ) නිවැරදි ලෙස පාලි පාඨ සිංහලට නැගීමට ලකුණු 01 කට ලකුණු 04 බැගින් ලකුණු 12 කි.

(ආ) නිවැරදි ලෙස වාක්‍ය පාලියට නැගීමට ලකුණු 01 කට ලකුණු 04 බැගින් ලකුණු 08 කි.

**(ලකුණු 20)**

03. **ප්‍රශ්නය**

i. නිවැරදි පිළිතුරට ලකුණු 04 කි.

ii. නිවැරදි ව ගාථාව සම්පූර්ණ කිරීමට ලකුණු 04 කි.

iii. නිවැරදි විවරණ සැපයීමකට ලකුණු 02 බැගින් ලකුණු 04 කි.

iv. නිවැරදි පදබෙදීමකට ලකුණු 01 බැගින් ලකුණු 04 කි.

v. නිවැරදි හිස්තැන් පිරවීමකට ලකුණු 01 බැගින් ලකුණු 04 කි.

**(ලකුණු 4 x 5 = 20)**

04. **ප්‍රශ්නය**

(අ) එක් නිවැරදි පිළිතුරකට ලකුණු 01 බැගින් ලකුණු 05 කි.

(ආ) එක් නිවැරදි සංන්ධි කිරීමකට ලකුණු 01 බැගින් ලකුණු 05 කි.

(ඉ) එක් නිවැරදි තද්ධිත ප්‍රභේද නම් කිරීමකට ලකුණු 01 බැගින් ලකුණු 05 කි.

(ඊ) එක් නිවැරදි සමාස කිරීමකට ලකුණු 01 බැගින් ලකුණු 05 කි.

**(ලකුණු 5 x 4 = 20)**

05. **ප්‍රශ්නය**

නිවැරදි එක් කොටසකට පිළිවෙලින් ලකුණු 2+4+4+4+6 බැගින් සම්පූර්ණ ලකුණු 20 කි.

**(ලකුණු 20)**

06. **ප්‍රශ්නය**

(අ) එක් නිවැරදි පිළිතුරකට ලකුණු 01 බැගින් ලකුණු 05 කි.

(ආ) එක් නිවැරදි පිළිතුරකට ලකුණු 01 බැගින් ලකුණු 07 කි.

(ඉ) නිවැරදි වාක්‍ය සහිත එක් කොටසකට ලකුණු 04 බැගින් ලකුණු 08 කි.

**(ලකුණු 20)**

07. **ප්‍රශ්නය**

(අ) එක් නිවැරදි පිළිතුරකට ලකුණු $^1/_2$ බැගින් ලකුණු 05 කි.

(ආ) එක් නිවැරදි පිළිතුරකට ලකුණු 01 බැගින් ලකුණු 07 කි.

(ඉ) අර්ථ සහිත එක් පාඨයකට ලකුණු 02 බැගින් ලකුණු 08 කි.

**(ලකුණු 20)**

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2018
# උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.

2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.

3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා අත්සන යොදන්න.

4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

(i) ............................................................
............................................................ √ △ $\frac{4}{5}$
............................................................

(ii) ............................................................
............................................................ √ △ $\frac{3}{5}$
............................................................

(iii) ............................................................
............................................................ √ △ $\frac{3}{5}$
............................................................

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = □ $\frac{10}{15}$

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

01. ලකුණු දීමේ පටිපාටිය අනුව නිවැරදි වරණ කවුළු පත්‍රයේ සටහන් කරන්න. එසේ ලකුණු කළ කවුළු බ්ලේඩ් තලයකින් කපා ඉවත් කරන්න. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබා ගත හැකි වන පරිදි විභාග අංක කොටුව හා නිවැරදි පිළිතුරු ගණන දක්වෙන කොටුව ද කපා ඉවත් කරන්න. හරි පිළිතුරු හා වැරදි පිළිතුරු ලකුණු කළ හැකි වන පරිදි එක් එක් වරණ පේළිය අවසානයේ හිස් තීරයක් ද කපා ඉවත් කරන්න. **කපා ගත් කවුළු පත්‍රය ප්‍රධාන පරීක්ෂකවරයා ලවා අත්සන් යොදා අනුමත කර ගන්න.**

02. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.

03. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර ✕ ලකුණකින් ද ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න. ලකුණු පරිවර්තනය කළ යුතු අවස්ථාවලදී පරිවර්තිත ලකුණු අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. **වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.**

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් **අංක දෙකකින් ලියා දක්වන්න.** ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

මෙවර එක් පත්‍රයක් පමණක් ඇති විෂයන් හැර ඉතිරි සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රයට අදාළ ලකුණු ලකුණු ලැයිස්තුවේ "I වන පත්‍රය" තීරුවේ **ඇතුළත් කර අකුරෙන් ද ලියන්න.** අදාළ විස්තර ලකුණු ඇතුළත් කර "II වන පත්‍රය" තීරුවේ II පත්‍රයේ අවසාන ලකුණු ඇතුළත් කරන්න. 43 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර **අකුරෙන් ද ලිවිය යුතු වේ.**

21 - සිංහල භාෂාව හා සාහිත්‍යය, 22 - දෙමළ භාෂාව හා සාහිත්‍යය යන විෂයන්හි I පත්‍රයේ ලකුණු ඇතුළත් කර අකුරෙන් ලිවිය යුතු ය. II හා III පත්‍රවල විස්තර ලකුණු ඇතුළත් කර ඒ ඒ පත්‍රයේ මුළු ලකුණු අදාළ තීරුවේ ඇතුළත් කළ යුතු ය.

**සැ.යු :- සෑම විටම එක් එක් පත්‍රයට අදාළ මුළු ලකුණු පූර්ණ සංඛ්‍යාවක් ලෙස I වන පත්‍රය II වන පත්‍රය හෝ III වන පත්‍රය තීරුවේ ඇතුළත් කළ යුතු ය. කිසිඳු අවස්ථාවක පත්‍රයේ අවසාන ලකුණු දශම සංඛ්‍යාවකින් නොතැබිය යුතු ය.**

***

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව இலங்கைப் பரீட்சைத் திணைக்களம் Department of Examinations, Sri Lanka

**66 STE**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2018 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2018 டிசெம்பர்
**General Certificate of Education (Ord. Level) Examination, December 2018**

පාලි
பாளி
**Pali**

12.12.2018 / 0830 – 1140

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
**Additional Reading Time - 10 minutes**

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.
வினாப்பத்திரத்தை வாசித்து, வினாக்களைத் தெரிவுசெய்வதற்கும் விடை எழுதும்போது முன்னுரிமை வழங்கும் வினாக்களை ஒழுங்கமைத்துக் கொள்வதற்கும் மேலதிக வாசிப்பு நேரத்தைப் பயன்படுத்துக.
**Use additional reading time to go through the question paper, select the questions and decide on the questions that you give priority in answering.**

| Q. NO | Marks |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| Total | |

| | |
|---|---|
| Entered by | |
| Checked by | |
| TOTAL MARKS | |

විභාග අංකය / சுட்டெண் / Index Number ............................

වැදගත් : මෙම ප්‍රශ්න පත්‍රයට එක් භාෂාවකින් පමණක් උත්තර සැපයිය යුතුයි.
முக்கியம் : இவ்வினாத்தாளுக்குரிய விடைகளை ஒரு மொழியில் மட்டுமே எழுதுதல் வேண்டும்.
**Important** : *This question paper should be answered entirely in one language only.*

※ **1** ප්‍රශ්නය හා **2** ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.
※ **1** ஆம் **2** ஆம் வினாக்கள் உள்ளிட்ட ஐந்து வினாக்களுக்கு இத்தாளிலேயே விடை எழுதுக.
※ *Answer five questions including questions* **1** *and* **2** *on this paper itself.*

**1.** පහත දී ඇති ප්‍රශ්නවල නිවැරදි පිළිතුරට යටින් ඉරක් අඳින්න.
பின்வரும் வினாக்களுக்கான சரியான விடையின் கீழே கோடிடுக.
Underline the correct answer of the following questions.

(i) නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පදය තෝරන්න.
சரியான எழுத்துக் கூட்டலுடனான சொல்லைத் தெரிவுசெய்க.
Select the word spelt correctly.

(1) පුරුසදම්මසාරථි (2) පුරුසදම්මසාරථී
(3) පුරිසදම්මසාරථී (4) පුරිසධම්මසාරථී
(1) purusadammasārathi (2) purusadammasārathī
(3) purisadammasārathī (4) purisadhammasārathī

(ii) ඉවසීම යන අදහස ඇති පාලි වචනය තෝරන්න.
பொறுமை எனும் கருத்தையுடைய பாளிச் சொல்லைத் தெரிவுசெய்க.
Select the Pali word that denotes the meaning patience.

(1) සන්ත (2) ඛන්ති (3) කිත්ති (4) සන්ති
(1) santa (2) khanti (3) kitti (4) santi

(iii) ව්‍යාකරණානුකූලව චරමානො යන පදය
இலக்கணப்படி **caramāno** எனும் சொல்,
Grammatically the term **caramāno** is a

(1) සන්ධියකි. (2) සමාසයකි. (3) තද්ධිතයකි. (4) කිතකයකි.
(1) சந்தி. (2) சமாஸம். (3) தத்திதம். (4) கித்தக.
(1) Combination. (2) Compound. (3) Secondary Derivative. (4) Primary Derivative.

(iv) කඤ්ඤා ශබ්දයේ චතුර්ථී ඒකවචන රූපය කුමක් ද?
**kaññā** எனும் பெயரின் சதுத்தீ (நான்காம் வேற்றுமை) ஏகவசன (ஒருமை) வடிவம் யாது?
What is the Dative singular form of noun **kaññā**?

(1) කඤ්ඤාය (2) කඤ්ඤස්ස (3) කඤ්ඤායං (4) කඤ්ඤානං
(1) kaññāya (2) kaññassa (3) kaññāyaṃ (4) kaññānaṃ

(v) **බින්දුසාරරාජා** යන්නේ නිවැරදි නිර්වචනය කුමක් ද?
**Bindusārarājā** என்பதன் சரியான வரைவிலக்கணம் யாது?
What is the correct definition of **Bindusārarājā**?

(1) බින්දුසාරො ච සො රාජා
(2) බින්දුසාරස්ස රාජා
(3) බින්දුං සාරං විය යස්ස රඤ්ඤො සො
(4) බින්දු ච සාරො ච රාජා ච
(1) Bindusāro ca so rājā
(2) Bindusārassa rājā
(3) Bindum sāraṃ viya yassa rañño so
(4) Bindu ca sāro ca rājā ca

(vi) **අප්පමත්තො පමත්තෙසු...** යනාදි ගාථාවෙහි අවසාන පදය තෝරන්න.
**appamatto pamattesu...** எனும் காதாவின் இறுதி அடியைத் தெரிவுசெய்க.
Select the last line of the verse **appamatto pamattesu...**

(1) සුත්තෙසු බහුජාගරො
(2) යෙ පමත්තා යථා මතා
(3) පප්පොති විපුලං සුඛං
(4) හිත්වා යාති සුමෙධසො
(1) suttesu bahujāgaro
(2) ye pamattā yathā matā
(3) pappoti vipulaṃ sukhaṃ
(4) hitvā yāti sumedhaso

(vii) දෝෂ සහිත උච්චාරණ රටාව ප්‍රකාශ වන පාලි පාඨය මේවායින් කුමක් ද?
பின்வருவனவற்றுள் எது தவறான உச்சரிப்புடனான பெயர்ப்பினை வெளிப்படுத்தும் தெரிவு ஆகும்?
Which of the following is the Pali excerpt with wrong pronunciation?

(1) සුරාමෙරයමජ්ඣපමාදට්ඨානා වෙරමණී සික්ඛාපදං සමාදියාමි.
(2) කායො ජිගුච්ඡො සකලො දුගන්ධො.
(3) ඉච්ඡිතං පත්ථිතං තුය්හං ඛිප්පමෙව සමිජ්ඣතු.
(4) ඝනසාරප්පදිත්තෙන දීපෙන තමධංසිනා

(1) Surāmerayamajjhapamādaṭṭhānā veramaṇī sikkhāpadaṃ samādiyāmi.
(2) Kāyo jiguccho sakalo dugandho.
(3) Icchitaṃ patthitaṃ tuyhaṃ khippameva samijjhatu.
(4) Ghanasārappadittena dīpena tamadhaṃsinā.

(viii) "බ්‍රාහ්මණා හත්ථෙ විධුනිංසු" යන්නෙහි තේරුම වන්නේ
"brāhmaṇā hatthe vidhuniṃsu." என்பதன் கருத்து யாது?
The meaning of "brāhmaṇā hatthe vidhuniṃsu." is

(1) බ්‍රාහ්මණයෝ අතෙහි තැබූහ.
(2) බ්‍රාහ්මණයෝ අත්පොළසන් දුන්හ.
(3) බ්‍රාහ්මණයෝ අත් සැලූහ.
(4) බ්‍රාහ්මණයෝ අත් පෙන්වූහ.
(1) Brahmins kept on hand.
(2) Brahmins clapped.
(3) Brahmins moved hands.
(4) Bhahmins showed hands.

(ix) **පෙමතො ජායතී සොකො** යන්නෙහි **පෙමතො** යන වචනයේ විභක්තිය කුමක් ද?
**pemato jāyatī soko** என்பதில் வரும் **pemato** எனும் சொல்லின் விபக்தி (வேற்றுமை) யாது?
What is the Case of the word **pemato** in **pemato jāyatī soko**?

(1) පඨමා (2) තතියා (3) චතුත්ථී (4) පඤ්චමී
(1) paṭhamā (2) tatiyā (3) catutthi (4) pañcamī

(x) **පුරුෂයන් දසදෙනා අතර පළමුවැන්නා** යන අදහස දෙන පාඨය ඇතුළත් වරණය තෝරන්න.
பத்து மனிதர்களுள் முதலாமவர் எனும் கருத்தைத் தரும் தொடரினைக் கொண்ட தெரிவினைத் தேர்ந்தெடுக்குக.
Select the option with the phrase that gives the meaning the **first of the ten men.**

(1) දසපුරිසා පඨමො
(2) දසහි පුරිසෙහි පඨමො
(3) දස පුරිසස්ස පඨමො
(4) දසසු පුරිසෙසු පඨමො
(1) dasapurisā paṭhamo
(2) dasahi purisehi paṭhamo
(3) dasa purisassa paṭhamo
(4) dasasu purisesu paṭhamo

(2 × 10 = 20 *marks*)

**ලකුණු දීමේ ක්‍රමය**

එක් නිවැරදි පිළිතුරකට ලකුණු 02 බැගින් ලකුණු 20 ක් හිමි වේ.

## 02. ප්‍රශ්නය හා ආදර්ශ පිළිතුර

(අ) පහත දැක්වෙන පාලි පාඨ **සිංහලට** නගන්න.

(i) ස්වාක්ඛාතො භගවතා ධම්මො සන්දිට්ඨිකො අකාලිකො එහිපස්සිකො ඔපනයිකො පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහීති.

භාග්‍යවතුන් වහන්සේ විසින් සාන්දෘෂ්ටික වූ අකාලික වූ ඒහිපස්සික වූ ඕපනයික වූ ප්‍රාඥයන් විසින් වෙන් වෙන් වශයෙන් දතයුතු වූ ධර්මය මැනවින් දෙසන ලදී.

(ii) එකදිවසං කිර කොසලමහාරාජා රත්තිං නිද්දූපගතො පච්ඡිමෙ යාමෙ සොළසමහාසුපිනෙ දිස්වා භීතතසිතො පබුජ්ඣිත්වා ඉමෙසං සුපිනානං දිට්ඨත්තා කින්නු ඛො මෙ භවිස්සතීති මරණභයතජ්ජිතො සයනපිට්ඨෙ නිසින්නකොව විතිනාමෙසි.

එක් දවසක් වනාහි කොසොල් මහරජ රාත්‍රියේ නින්දට එළඹියේ අලුයම් යාමයෙහි සොළොස් මහා සිහින දැක බියෙන් තැතිගත්තේ පිබිද මේ සිහින දුටු හෙයින් මට කුමක් වන්නේ දැයි මරණ බයෙන් තැති ගත්තේ යහන මත හුන්නේ ම කල් යැවීය.

(iii) තස්මිං කාලෙ සුමෙධතාපසො අත්තනො අස්සමපදා උග්ගන්ත්වා තෙසං මනුස්සානං උපරිභාගෙන ආකාසෙන ගච්ඡන්තො තෙ හට්ඨතුට්ඨෙ මනුස්සෙ දිස්වා 'කින්නු ඛො කාරණ'න්ති ආකාසතො ඔරුය්හ එකමන්තං ඨිතො මනුස්සෙ පුච්ඡි.

එකල්හි සුමේධ තාපස තෙමේ තම අසපුවෙන් උඩට නැගී ඒ මිනිසුන්ගේ මත්තෙන් අහසෙන් යන්නේ තුටුපහටු වූ ඒ මිනිසුන් දැක ආකාශයෙන් බැස එකත්පසක සිටියේ කුමන කාරණයක් දැයි මිනිසුන්ගෙන් විචාළේය.

(ආ) පහත දැක්වෙන වාක්‍ය **පාලියට** නගන්න.

(i) බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා ලෝකයාට පින් කෙතක් වේ.

බුද්ධස්ස සාවකසංඝො ලොකස්ස පුඤ්ඤක්ඛෙත්තං හොති.

(ii) මුගලන් තෙරුන් වහන්සේ මනෝමය ශරීරයක් මවාගෙන තව්තිසාවට වැඩි සේක.

මොග්ගල්ලානත්ථෙරො මනොමයං කායං මාපෙත්වා තවතිංසං අගමාසි.

**ලකුණු දීමේ ක්‍රමය**

(අ) කොටසට ලකුනු 04 බැගින් හිමි වේ. දුෂ්කර පද මගහරිමින් කර ඇති මනඃකල්පිත පරිවර්තනවලට සුදුසු පරිදි ලකුණු අඩු කරන්න.

(ආ) කොටසේ එක් වාක්‍යකට ලකුණු 04 බැගින් හිමි වේ. එක් වරදකට ලකුණු එක බැගින් අඩු කරන්න.

## 03. ප්‍රශ්නය හා ආදර්ශ පිළිතුර

**පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(i) **පහත දැක්වෙන ගාථාවෙහි නිවැරදි අර්ථය ලියන්න.**

මා පමාදමනුයුඤ්ජෙථ - මා කාමරතිසන්ථවං,
අප්පමත්තො හි ඣායන්තො - පප්පොති විපුලං සුඛං.

ප්‍රමාදයෙහි නො යෙදෙවු. තෘෂ්ණාවෙන් කාමයෙහි ඇල්ම නො කරවු.
ධ්‍යාන වඩන්නා වූ අප්‍රමාදී තැනැත්තා ඒකාන්තයෙන් මහත් සැපතට පැමිණෙයි.

(ii) 'උට්ඨානවතො සතිමතො...' යනාදි ගාථාව නිවැරදි අක්ෂර වින්‍යාසය සහිතව ලියා දක්වන්න.

උට්ඨානවතො සතිමතො - සුචිකම්මස්ස නිසම්මකාරිනො
සඤ්ඤතස්ස ච ධම්මජීවිනො - අප්පමත්තස්ස යසොභිවඩ්ඪති.

(iii) පහත දැක්වෙන පදවලින් දෙකකට බෞද්ධ සාහිත්‍යාත්මක විවරණ සපයන්න.

(1) යොගක්ඛෙමං

යෝග යනු සත්ත්වයා සසරෙහි යොදවන කාම, භව, දිට්ඨි. අවිජ්ජා යන සතර යොගයන්ය. එම යොගයන්ගෙන් මිදුණු හෙයින් නිවන **යොගක්ඛෙම** නමින් හඳුන්වයි.

(2) බහුජාගරො

බහුජාගරො යනු බොහෝ කොට නිදි වරන්නා ය. නිද්‍රාශීලී බව බුදු දහමේ අගය නො කරයි. බවුන් වඩමින් මහණදම් පිරීම සඳහා බොහෝ සෙයින් අවදි ව සිට කටයුතු කිරීම මෙහි බහුජාගරො යන්නෙන් අදහස් වේ.

(3) සංයොජනං

"සංයොජන" යනු සත්ත්වයා සසර බැඳ තබන ධර්මයන් ය. ඒවා දහයකි.
සක්කායදිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බතපරාමාස, කාමරාග, පටිඝ, රූපරාග, අරූපරාග, මාන, උද්ධච්ච, අවිජ්ජා යනු ඒවා ය. මේවා ප්‍රහාණය කිරීමෙන් කෙළෙස් ප්‍රහීණ වේ.

(4) මඝවා

"මඝවා" යනු ශක්‍රයාට නමකි. ඔහු මඝමානවක ලෙස උපන් අවදියේ දි මං මාවත් තැනීම ළිං පොකුණු කැණීම ආදී සැමදා පිං වැඩෙන පිංකම් කොට මරණින් මතු ශක්‍රයා වී උපන්නේය. එබැවින් ශක්‍රයා මඝවා යන විශේෂ නාමයෙන් හැඳින්වේ.

(iv) **පහත දැක්වෙන ගාථා පාඨ නිවැරදි පද බෙදීම් සහිතව ලියන්න.**

(1) අධිවාසෙ තුනො භන්තෙ - අධිවාසෙතු නො භන්තෙ.

(2) යො වද තංපව රොමනු ජෙසු - යො වදතං පවරො මනුජෙසු.

(3) මාමෙ බාල සමාගමො - මා මෙ බාලසමාගමො.

(4) පුඤ්ඤෙද නමෙ තෙ නව හොතු මොක්ඛං - පුඤ්ඤෙන මෙ තෙන ච හොතු මොක්ඛං.

(v) **තද කළු අකුරින් දී ඇති පදවලින් අදාළ පදය යොදා පහත ගාථා පාදවල හිස්තැන් සම්පූර්ණ කරන්න.**

**ගන්ධාරවිසයෙ, චතස්සෙතෙ, තිදසපුරෙ, නරදෙවෙහි**
**gandhāravisaye, catassete, tidasapure, naradevehi**

(1) එකා දාඨා ...තිදසපුරෙ..., එකා නාගපුරෙ අහු.

Ekā dāṭhā ......................., ekā Nāgapure ahu.

(2) එකා ...ගන්ධාරවිසයෙ..., එකාසි පුන සීහළෙ.

Ekā ...................., ekāsi puna Sīhaḷe.

(3) ...චතස්සෙතෙ..., මහාදාඨා නිබ්බාණරසදීපිකා.

......................., mahādāṭhā nibbāṇarasadīpikā.

(4) පූජිතා ...නරදෙවෙහි..., අහං වන්දාමි ධාතුයො.

Pūjitā ...................., ahaṃ vandāmi dhātuyo.

**ලකුණු දීමේ ක්‍රමය**

(i) නිවැරදි පරිවර්තනයට ලකුණු 04 ක් හිමි වේ. අරුත් මගහැර ඇත්නම් එක් පදයකට ලකුණු භාගය බැගින් අඩු කරන්න.

(ii) නිවැරදි අක්ෂර වින්‍යාසය සහිතව ලියා ඇති එක් පාදයකට ලකුණු 01 බැගින් ලබා දෙන්න.

(iii) ආදර්ශ පිළිතුරෙහි දක්වා ඇති පරිදි මත්‍රිකාවට අදාළව ලියා ඇති ප්‍රමාණවත් පිළිතුරකට ලකුණු 02 බැගින් ලකුණු 04 ක් ලබා දෙන්න.

(iv) නිවැරදි පද බෙදීම් සහිත වාක්‍යයකට ලකුණු 01 බැගින් ලකුනු 04 ක් ලබා දෙන්න. එක් වරදකට ලකුණු භාගය බැගින් අඩු කරන්න.

(v) එක් නිවැරදි පිළිතුරකට ලකුණු 01 බැගින් ලකුණු 04 කි.

## 04. ප්‍රශ්නය හා ආදර්ශ පිළිතුර

(අ) පහත දැක්වෙන පදවල අර්ථය ලියා දක්වන්න.

(i) ජෙත්වා / jetvā ........ සිඳ/ කඩා
(ii) සිනෙහෙන / sinehena ........ සෙනෙහසින්
(iii) පුබ්බණ්හසමයෙ / pubbaṇhasamaye ........ පෙරවරුවෙහි
(iv) අභිවන්දිය / abhivandiya ........ වැඳ
(v) සින්ධු / sindhu ........ ගඟ/ මුහුද

(ආ) පහත දැක්වෙන විසන්ධි පද සන්ධි කරන්න.

(i) සමෙච්ච + අහං / samecca + ahaṃ ........ සමේච්චාහං
(ii) කිං + කතො / kiṃ + kato ........ කිඞ්කතො
(iii) අව + සිරො / ava + siro ........ අවංසිරො
(iv) ගහිතො + ඉති / gahito + iti ........ ගහිතොති
(v) සං + ලෙඛ / saṃ + lekha ........ සල්ලෙඛ

(ඉ) පහත දැක්වෙන පදවල තද්ධිත ප්‍රභේද නම් කරන්න.

(i) මායාවී / māyāvī ........ අත්‍ථ්‍යර්ථ තද්ධිතය
(ii) මුදුතා / mudutā ........ භාව තද්ධිතය
(iii) සාකටිකො / sākaṭiko ........ අනෙකාර්ථ තද්ධිතය
(iv) භාගිනෙය්‍යො / bhāgineyyo ........ අපච්චාර්ථ තද්ධිතය
(v) දිවාතරං / divātaraṃ ........ අත්‍ථ්‍යර්ථ තද්ධිතය

(ඊ) පහත දැක්වෙන අසමස්ත පද සමාස කර ලියන්න

(i) හත්ථං ගතං / hatthaṃ gataṃ ........ හත්ථගතං
(ii) පත්තං ච චීවරං ච / pattaṃ ca cīvaraṃ ca ........ පත්තචීවරං
(iii) ජීවස්ස යාව / jīvassa yāva ........ යාවජීවං
(iv) චණ්ඩාලානං ගාමො / caṇḍālānaṃ gāmo ........ චණ්ඩාලගාමො
(v) අසොකො කුමාරො / Asoko kumāro ........ අසොකකුමාරො

**ලකුණු දීමේ ක්‍රමය**

එක් නිවැරදි පිළිතුරකට එක් ලකුණ බැගින් ලකුණු 20 ක් හිමි වේ.

## 05. ප්‍රශ්නය හා ආදර්ශ පිළිතුර

**පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

අතීතෙ බාරාණසියං බ්‍රහ්මදත්තෙ රජ්ජං කාරෙන්තෙ හිමවන්තප්පදෙසෙ අරඤ්ඤායතනෙ පබ්බතගුහායං අනෙකසතා එළකා වසන්ති. තෙසං වසනට්ඨානතො අවිදූරෙ එකිස්සා ගුහාය පූතිමංසො නාම සිගාලො වෙණියා නාම භරියාය සද්ධිං වසති. සො එකදිවසං භරියාය සද්ධිං විචරන්තො තෙ එළකෙ දිස්වා එකෙන උපායෙන ඉමෙසං මංසං ඛාදිතුං වට්ටතී'ති චින්තෙත්වා උපායෙන එකෙකං එළකං මාරෙසි. තෙ උභො'පි එළකමංසං ඛාදන්තා ථාමසම්පන්නා ථූලසරීරා අහෙසුං, අනුපුබ්බෙන එළකා පරික්ඛයං අගමංසු. තෙසං අන්තරෙ මෙළමාතා එළිකා ව්‍යත්තා අහොසි උපායකුසලා. සිගාලො තං මාරෙතුං අසක්කොන්තො එකදිවසං භරියාය සද්ධිං මන්තෙසි.

(i) මෙහි සඳහන් ස්වාමි - භාර්යා දෙදෙනාගේ නම් පිළිවෙළින් ලියා දක්වන්න.

**පූතිමංස වේණි.**

(ii) එළකමංස, පූතිමංස, ථූලසරීර, මන්තෙති යන පදවල තේරුම් ලියන්න.

එළුමස්, කුණු මස්, මහත් ශරීරය, මන්ත්‍රණය කරයි.

(iii) **බාරාණසියං බ්‍රහ්මදත්තෙ රජ්ජං කාරෙන්තෙ** යන්නෙහි ව්‍යාකරණ ප්‍රයෝගය පැහැදිලි කරන්න.

මෙය භාව සත්තමී ප්‍රයෝගයකි. භාව සත්තමී ප්‍රයෝගයේ දී මුලින් යෙදෙන වාක්‍යයේ කර්තෘ පදයත් ඒ හා බැඳෙන කිතක පදයත් සත්තමී විභක්තියෙන් තැබීම රීතියයි.

(iv) මෙහි සඳහන් වඩාත් බුද්ධිමත් චරිතය නම් කොට එසේ සැලකීමට හේතුව පහදන්න.

මෙළමාතා චරිතයයි. ඇය බුද්ධිමත් ලෙස සැළකෙනුයේ කරුණු දෙකක් නිසා ය. එනම් **ව්‍යක්ත බව හා උපායෙහි දක්ෂ බවයි.**

(v) **උපායකුසලා** යන්න විවරණය කරන්න.

"උපායකුසලා" යන්නෙහි අර්ථය උපායෙහි දක්ෂ වූවා යන්නයි. එයින් අදහස් වන්නේ නිසි දේ නිසි තැන නිසි පරිදි සිදු කිරීමේ හැකියාවයි. **උපාය කෞශල්‍ය ඥානය** බුදුරදුන්ට ද පැවති ඥාන ශක්තියකි.

**ලකුණු දීමේ ක්‍රමය**

| | |
|---|---|
| (i) | එන් නිවැරදි පිළිතුරකට ලකුණු 01 බැගින් ලකුණු 02 කි. |
| (ii) | එක් නිවැරදි පිළිතුරකට ලකුණු 01 බැගින් ලකුණු 04 ක් හිමි වේ. |
| (iii) | නිවැරදි පැහැදිලි කිරීමට හිමි ලකුණු සංඛ්‍යාව 04 කි. ව්‍යාකරණ ප්‍රයෝගය නම් කිරීමට ලකුණු 01 ක් ද, ප්‍රමාණවත් විවරණයට ලකුණු 03 ක් ද වශයෙන් ලකුණු 04 පිරි නමන්න. |
| (iv) | චරිතය නම් කිරීමට ලකුනු 02 ක් ද හේතුව දැක්වීමට ලකුණු 02 ක් ද වශයෙන් ලකුණු 04 පිරි නමන්න. |
| (v) | ආදර්ශ පිළිතුරෙහි දක්වා ඇති පරිදි ප්‍රමාණවත් පිළිතුරක් සපයා ඇත්නම් ලකුණු 06 ක් පිරිනමන්න. ප්‍රමාණවත් නොවන පිළිතුරු සඳහා සුදුසු පරිදි ලකුණු අඩු කරන්න. |

## 06. ප්‍රශ්නය හා ආදර්ශ පිළිතුර

(අ) පහත දී ඇති ශබ්දවලට සමානව වරනැගෙන ශබ්දය වරහන තුළින් තෝරා හිස්තැන් පුරවන්න.

(i) ඵල ........පුඤ්ඤ........ (වාරි, පුඤ්ඤ, යාගු, බ්‍රහ්ම)
phala ................................ (vāri, puñña, yāgu, Brahma)

(ii) බුද්ධ ........වරාහ........ (රූප, ගච්ඡන්ත, මන, වරාහ)
Buddha ................................ (rūpa, gacchanta, mana, varāha)

(iii) අග්ගි ........ගිරි........ (හත්ථි, භූමි, ගිරි, අට්ඨි)
aggi ................................ (hatthi, bhūmi, giri, aṭṭhi)

(iv) ආයු ........චක්ඛු........ (චක්ඛු, ධෙනු, භික්ඛු, පිතු)
āyu ................................ (cakkhu, dhenu, bhikkhu, pitu)

(v) කඤ්ඤා ........පඤ්ඤා........ (පඤ්ඤා, තරුණී, යුවතී, කුමාරී)
kaññā ................................ (paññā, taruṇī, yuvatī, kumārī)

(ආ) මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අදාළ පදය වරහන් තුළ දී ඇති පදවලින් තෝරා හිස්තැන්පුරවන්න.

(උට්ඨාපෙසි, කරොති, ඛිප්පං, දූරතොව, පතිගණ්හාතුං, පූජිතො, සකුණො)
(uṭṭhāpesi, karoti, khippaṃ, dūratova, patigaṇhātuṃ, pūjito, sakuṇo)

(i) නාම / nāma ........සකුණො........
(ii) සන්ධි / sandhi ........දූරතොව........
(iii) නිපාත / nipāta ........ඛිප්පං........
(iv) කිතක / kitaka ........පූජිතො........
(v) තුමන්ත / tumanta ........පතිගණ්හාතුං........
(vi) ප්‍රයෝජ්‍ය ක්‍රියා / prayojya ........උට්ඨාපෙසි........
(vii) ආඛ්‍යාත / ākhyāta ........කරොති........

(ඉ) පහත දැක්වෙන මාතෘකා අනුව කෙටි පාලි වාක්‍ය **හතර** බැගින් ලියන්න.

(i) බුද්ධවන්දනා
(ii) ධම්මදෙසනා

මාතෘකාවට අදාළව කර්තෘ කර්මය හා ආඛ්‍යාතය නිසි ලෙස ප්‍රකාශ වන පරිදි වාක්‍ය හතරක් ලියා තිබීම ප්‍රමාණවත්ය.

**ලකුණු දීමේ ක්‍රමය**

(අ) එක් නිවැරදි පිළිතුරකට ලකුණු 01 බැගින් ලකුණු 05 ක් පිරිනමන්න.
(ආ) එක් නිවැරදි පිළිතුරකට ලකුණු 01 බැගින් ලකුණු 07 ක් පිරිනමන්න.
(ඉ) නිවැරදි කර්තෘ, කර්ම, ක්‍රියා සහිත වාක්‍යයකට ලකුණු 01 බැගින් ලකුණු 08 ක් පිරිනමන්න. අඩුපාඩු සහිත වාක්‍යවලට සුදුසු පරිදි ලකුණු අඩු කරන්න.

## 07. ප්‍රශ්නය හා ආදර්ශ පිළිතුර

(අ) පහත දී ඇති ක්‍රියාපදවල කාලය, වචනය හා පුරුෂය සැලකිල්ලට ගෙන වගුවේ හිස්තැන් නිවැරදිව සම්පූර්ණ කරන්න.

| වත්තමානා (වර්තමාන) | අජ්ජතනී (අතීත) | භවිස්සන්ති (අනාගත) |
|---|---|---|
| ගච්ඡන්ති | ගච්ඡිංසු | ගච්ඡිස්සන්ති |
| පචථ | අපචිත්ථ - පචිත්ථ | පචිස්සථ |
| භවසි | අභවො - භවො | භවිස්සසි |
| පචාමි | පචිං | පචිස්සාමි |
| වන්දාම | අවන්දිම්හා, වන්දිම්හා | වන්දිස්සාම |

(ආ) පහත වගුවේ හිස්තැන් **අම්හ** ශබ්ද ඇසුරෙන් පුරවන්න.

| විභත්ති | ඒකවචන | බහුවචන |
|---|---|---|
| පඨමා | අහං | මයං, අම්හෙ |
| දුතියා | මං, මමං, මෙ | අම්හෙ |
| තතියා | මයා | අම්හෙහි, අම්හෙභි |
| චතුත්ථී | මම, මය්හං, අම්හං, මමං | අම්හාකං |
| පඤ්චමී | මයා | අම්හෙහි |
| ඡට්ඨී | මය්හං | අම්හාකං අම්හෙ, නො |
| සත්තමී | මයි | අම්හෙසු |

(ඉ) අවමංගල ශෝක ප්‍රකාශයකට සුදුසු **පාලි පාඨ හතරක්,** ඒවායේ නිවැරදි අර්ථ සමග ලියා දක්වන්න.

i. අනිච්චා වත සංඛාරා - සංස්කාරයෝ ඒකාන්තයෙන් ම අනිත්‍යයහ.
ii. හා! මතන්තා සජීවකා - අහෝ! ජීවත්වන්නාහු මරණය කෙළවර කොට ඇත්තාහ.
iii. මරණන්තං හි ජීවිතං - ජීවිතය වනාහි මරණය කෙළවර කොට ඇත්තේය.
iv. සබ්බෙ සංඛාරා අනිච්චා - සියලු සංස්කාරයෝ අනිත්‍යයහ.
v. මරණං චිත්තවිබ්භමං - මරණය චිත්ත විභ්‍රමයකි.
vi. ජාතස්ස මරණං හොති - උපන්නහුට මරණය වෙයි.
vii. ජනනා'වධි මරණං මරණා'වධි ජනනං - උපතේ සීමාව මරණයයි. මරණයේ සීමාව උපතයි.
viii. අපාපකං තෙ මරණං භවිස්සති - ඔබගේ මරණය ළාමක වූවක් නො වන්නේය.
ix. සබ්බෙ මරණධම්මා මරණං අනතීතා - සියල්ලෝ මරණය ස්වභාව කොට ඇත්තාහ. මරණය නො ඉක්මූ වූවාහුය.
x. කාමං වජන්ති මරණං තිභවෙසු සත්තා - තුන්ලෝකයෙහි සත්ත්වයෝ ඒකාන්තයෙන් මරණයට යති.

**ලකුණු දීමේ ක්‍රමය**
(අ) එක් නිවැරදි පිළිතුරකට ලකුණු $^1/_2$ බැගින් ලකුණු 05 ක් පිරිනමන්න.
(ආ) එක් නිවැරදි පිළිතුරකට ලකුණු 01 බැගින් ලකුණු 07 ක් පිරිනමන්න.
(ඉ) පාඨය නිවැරදිව ලිවීමට එක් ලකුණක් ද අර්ථය නිවැරදිව ලිවීමට එක් ලකුණක් ද බැගින් ලකුණු 08 ක් පිරිනමන්න.